**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව 2013**

**--------------------------------------------------------**

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 34 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභා වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්

කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි උපචිත සංකල්පය අනුව සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් හා වියදම් පමණක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දැක්විය යුතු වුවද ගිවිසුම් වලට එළඹ නොමැති සහ 2013 වර්ෂය තුල ඉටු නොකරන ලද කාර්යයන් වෙනුවෙන් රු.4,832,800 ක් වූ වෙන්කිරීම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේදී පරිගණක හා කාර්යාල උපකරණ ස්ථාවර වත්කම්වලට අදාල ලෙජර් ගිණුම් හා උපලේඛන සැසඳීමේදී රු.843,895 ක්ද ලී බඩු හා සවිකිරිම් ක්ෂය, පරිගණක හා කාර්යාල උපකරණ ක්ෂය යන ක්ෂය විෂයයන් දෙකට අදාල ලෙජර් ගිණුම් හා උපලේඛන සැසඳීමේදී පිළිවෙලින් රු.1,194,568 ක් හා රු.915,991 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

**2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලිහිසිතෙල් නියාමනය වෙනුවෙන් කොමිෂන් සභාව සමඟ එළඹෙන ලද ගිවිසුම්වලට අනුව විවලා ලියාපදිංචි ගාස්තු අර්ධ වාර්ෂිකව දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වුවද ආයතන 03 කින් ඉකුත් වර්ෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා පිළිවෙලින් රු.487,743 ක් හා රු.1,119,122 ක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) උත්පාදන බලපත්‍රලාභීන් වෙත නිකුත් කරනු ලබන, උත්පාදන බලපත්‍රයේ කොන්දේසි අංක 11 ප්‍රකාර අදාල වර්ෂයේ ජූනි 30 දිනට හෝ ඊට පෙරදී හෝ පද්ධතියට විදුලිය සැපයීම ආරම්භ කළ දිනයේ සිට දින 30 ක් ඇතුළත වාර්ෂික නියාමන ගාස්තු, බලපත්‍රලාභීන් විසින් කොමිෂන් සභාවට ගෙවිය යුතු වුවද 2012 හා 2013 වර්ෂවලට අදාලව රු.252,000 ක් වූ නියාමන ගාස්තු 2013 දෙසැම්බර් 31 දින වන විටද අයකරගෙන නොතිබුණි.

**2.5 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

---------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා උපාංග ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඇ) 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය | ගුවන් ගමන් සඳහා රජය සතු ගුවන් සමාගම් වලින් ගුවන් ගමන් සේවා සපයා ගත යුතු වුවද කොමිෂන් සභා නිලධාරියෙකු විසින් පෞද්ගලික ගුවන් සමාගමක් වෙතින් සේවා සළසා ගෙන තිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2000 ජනවාරි 31 දිනැති අංක පීඑෆ්/පීඊ/6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 24 ඡේදය | ඉකුත් වර්ෂ වලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද සේවකයින් විසින් ගෙවිය යුතු රු. 843,153 ක් වූ උපයන විට ගෙවීම් බදු කොමිෂන් සභාවේ අරමුදලෙන් ගෙවා තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා කොමිෂන් සභාවේ අරමුදල් මෙහෙයුම් වලින් රු. 9,482,122 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.29,967,560 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.20,485,438 ක අඩුවීමක් දක්නට ලැබුණි. මේ සඳහා ඉකුත් වර්ෂයට සාපේක්ෂව විචල්‍ය ලියාපදිංචි ගාස්තු ආදායම රු. 4,225,248 කින් අඩුවීම හා පුද්ගල පඩිනඩි, විදේශීය හා දේශීය පුහුණු වියදම් හා අනෙකුත් වියදම් පිළිවෙලින් රු.3,671,380 කින්, රු.3,562,380 කින් හා රු.3,997,574 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 විග්‍රහාත්මක සමාලෝචනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ජංගම අනුපාතය 13:1 ක් හා පෙර වර්ෂයේ එම අනුපාතය 10:1 ක් වූ බැවින් එක් ජංගම වගකීමක් නිරවුල් කිරිම සඳහා වැඩි ජංගම වත්කම් ප්‍රමාණයක් පවත්වාගෙන යන බව නිරීක්ෂණය වන අතර මුළු ජංගම වත්කම් වලින් සියයට 24 ක් කෙටිකාලීන ආයෝජනවලින් නියෝජනය වී තිබුණි. මෙම හේතුව නිසා කොමිෂන් සභාවේ ජංගම වත්කම් කළමනාකරණය ප්‍රශස්ථ මට්ටමක නොතිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව විසින් පිළියෙල කරන ලද වාර්ෂික වාර්තාව ප්‍රකාරව 2012 හා 2013 වර්ෂ තුළදී පුනර්ජීවනීය බලශක්ති සංවර්ධන ව්‍යාපෘති සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව හා ඒවායේ ධාරිතාවයන් පහත දැක්වේ.

| තාක්ෂණය | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | බලපත්‍ර සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො) | බලපත්‍ර සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො) |
| ජල විදුලිය | 42 | 91.30 | 10 | 37.8 |
| සුළං බලය | 04 | 28.40 | 01 | 9.8 |
| ජෛව ස්කන්ධ | 10 | 51.00 | 01 | 10.0 |
| සූර්ය බලය | 01 | 0.12 | - | - |
| | 57 | 170.82 | 12 | 57.6 |

(ආ) කොමිෂන් සභාව විසින් විදුලිබල උත්පාදනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු 2009 වර්ෂයේ ආරම්භ කර තිබූ අතර එම වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා සුළු පරිමාණ විදුලි උත්පාදකයන් සඳහා විදුලි උත්පාදන බලපත්‍ර 188 ක් නිකුත් කර තිබුණද 2013 දෙසැම්බර් 31 දින වන විට එම බලපත්‍රලාභීන්ගෙන් 67 දෙනෙකු විදුලි බලය උත්පාදනය කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු බලපත්‍රලාභීන් විසින් වාණිජ කටයුතු ආරම්භ කළ යුතු නිශ්චිත කාල සීමාවක් හඳුන්වා දී නොතිබූ අතර බලපත්‍රලාභීන් පිළිබඳ පසුවිපරම් කටයුතු කොමිෂන් සභාව විසින් සිදු කර නොතිබුණි.

(ඇ) **පාරිභෝගික උපදේශන කමිටුව.**

සමාලෝචිත වර්ෂය සඳහා වූ පාරිභෝගික උපදේශන කමිටු රැස්වීම් වාර්තා පරීක්ෂා කිරීමේදී පළාත් 09 න් බොහෝ පළාත්වල උපදේශන කමිටු වලට සමහර මාස සඳහා සාමාජිකයින් පත්කර නොතිබූ අතර, වයඹ පළාත වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහාම සාමාජිකයෙකු පත්කරගෙන නොතිබූ බව අනාවරණය විය. එසේම සමාලෝචිත වර්ෂය තුළදී පාරිභෝගික උපදේශන කමිටුව සඳහා රු.905,030 ක් දරා තිබුණද එම කමිටු පත්කිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු වී ඇති බවට විගණනයට සෑහීමකට පත්විය නොහැකි විය.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 අප්‍රේල් මාසයේ දකුණු ආසියා යටිතල පහසුකම් නියාමන සංසදය මගින් බංගලාදේශයේ පැවති සමුළුවකට සහභාගී වූ නිලධාරියෙකුට ගෙවන ලද රු. 55,000 ක අත්තිකාරම්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර ගෙන නොතිබුණි.

(ආ) කුලී වාහන ලබා ගැනීම සඳහා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 ඡේදය පරිදි ප්‍රසිද්ධ දැන්වීමක් මගින් තරඟකාරී මිල ගණන් කැඳවීමක් සිදු නොකර ආයතන තුනකින් පමණක් මිල ගණන් කැඳවා වර්ෂ ගණනාවක සිට එක් පෞද්ගලික ආයතනයක් තෝරා ගෙන තිබුණි. වාර්ෂිකව මිල ගණන් සංශෝධනය කරමින් එම ආයතන සමඟ නව ගිවිසුම්වලට දෙපාර්ශවය එළඹ තිබීම නිසා තරඟකාරීත්වය තුලින් ආයතනයට වාසි සහගත කුලී සේවයක් ලබා ගැනීමට තිබූ අවස්ථාව අහිමිවී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා පමණක් රු.479,538 ක් වාහන කුලී ලෙස එම ආයතනයට ගෙවා තිබුණි.

(ඇ) 2012/2013 වර්ෂයට අදාල කොමිෂන් සභාවේ වාහනයකට අර්ධ සුඛෝපභෝගි බදු ගෙවීම ප්‍රමාදවීම නිසා රු. 12,500 ක දඩ මුදලක් ගෙවා තිබුණි.

### 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 45 ක් සහ තථ්‍ය සේවක සංඛ්‍යාව 41 ක් වන අතර පුරප්පාඩු සේවක සංඛ්‍යාව 4 ක් බව නිරීක්ෂණය විය.

(ආ) නිලධාරින් බඳවා ගැනීමේදී හා වැටුප් තිරණය කිරිමේදී 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා දොපර්තමේන්තුවේ චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ආයතනයන්හි වැටුප් හා දීමනා සංශෝධනය කිරිම සඳහා වන යෝජනා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමු කර එකී නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව කටයුතු කළයුතුය. නමුත් කොමිෂන් සභාව ඊට පටහැනිව 2013 වර්ෂයේ නිලධාරින් තිදෙනෙකු බඳවා ගෙන 2013 ඔක්තෝබර් සිට ක්‍රියාත්මකවන පරිදි නව වැටුප් සංශෝධනයක්ද සිදු කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------

### 5.1 අයවැය ලේඛනමය පාලනය

------------------------------

අයවැය ලේඛනය හා ආදායම් සහ වියදම් අතර සැලකිය යුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

**------------------------------**

2011 ඔක්තෝබර් 17 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මෙන්ම 2012 අගෝස්තු 09 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදීද, 2009 මැයි 26 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 39 අනුව කටයුතු කළ යුතු බවට නියෝග කර තිබුණද එම නියෝග මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ) විදේශ ගමන්

(ආ) බලපත්‍ර ගාස්තු හා නියාමන ගාස්තු අයකර ගැනීම.